# හොල්මන් නේවාසිකාගාරය



කර්තෘ : කේ.එම්. ගඟුලි ශමීක්ෂණා කුලතුංග

ග්‍රන්ථයේ නම : හොල්මන් නේවාසිකාගාරය

කර්තෘ : කේ.එම්. ගඟුලි ශමීක්ෂණා කුලතුංග

පිටකවරය හා චිත්‍ර : කේ.එම්. ගඟුලි ශමීක්ෂණා කුලතුංග

කර්තෘගේ වෙනත් කෘති: කතන්දර පැංචා

**2023** දෙසැම්බර් **07**

**ISBN 978-624-206-989-0**

# පිදුම

මෙම පොත නිර්මාණය කිරීමට මා දිරිමත් කළ

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ

ගරු විදුහල්පතිනිය, ගුරු මහත්ම මහත්මීන්ට හා මාගේ දෙමව්පියන්ට මෙම පොත ආදරයෙන් පුදමි!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.10.20

නෙතුලියි , මෙතුලියි හොඳම යාළුවෝ. එයාලා සිටියේ එකම පාසලේ එකම නේවාසිකාගාරයේ. නමුත් ඒ පාසලේ නේවාසිකාගාර දෙකක් තිබුණා. එකක් හරිම පරණයි වගේම පාළුයි. අනිත් එකේ තමයි නෙතුලියි , මෙතුලියි සිටියේ. ඒකේ තමයි අනිත් ළමයිනුත් හිටියේ.



දවසක් රෑ නෙතුලි එයාගේ කාමරයේ නිදාගෙන සිටින විට ඇසුණා මොකක් හරි වීදුරුවක් වැටෙනවා වාගේ සද්දයක්. එයා ජනේලයෙන් එළිය බැලුවා. නෙතුලි දැක්කා අර පාළු නේවාසිකාගාරයේ රතු පාට එළියක් මතු වෙනවා. ඒ වෙලාවේ රෑ දොළහේ සීනුව නාද වුණා.




නෙතුලිට හිතුණා ඒ පාලු නේවාසිකාගාරයේ මොකක්ද වෙන්නේ කියලා දැන ගන්න. එයා රාත්‍රියේම මෙතුලිට ලියුමක් ලිව්වා. ඒකේ මෙහෙම දෙයක් ලියලා තිබුණා,

"දයාබර මෙතුලි වෙත...

මම අද රෑ අර පාළු නේවාසිකාගාරය බලන්න යනවා. මං දැක්කා ඊයේ ඒකේ රතු පාට එළියක් තියෙනවා. ඒ මොකක්ද කියන එක මට හරි කුතුහලයක්. ඒ නිසා මම ඒ මොකක්ද කියලා බලන්න යනවා.මම අනිවාර්යයෙන් ආපහු එනවා. බය වෙන්න එපා."

නෙතුලි



නෙතුලි ඒ ලියුම එයාගේ කාමරයේ දොරේ ගහලා, රාත්‍රියේම පරණ නේවාසිකාගාරයට ගියා. එයා ඇතුළට ගියාම දැක්කා එක කාමරයක ඒ රතු පාට එළිය තියෙනවා. නෙතුලි ඒ කාමරයේ දොර ළඟට ගියාම එක අවතාරයක් එයාට පහර දුන්නා. එයා දුවලා ගිහින් එහි තවත් කාමරයක් ඇතුළට ගියා.



ඒ කාමරය ඇතුලේ මමියක් තිබුණා. ඒ කාමරයේ බිත්තියේ ගහලා තිබුණා "ජේ.කේ.රොස්මන්" කියලා.එවිට නෙතුලිට මතක් වුණා පාසලේ ප්‍රධාන ශාලාවේ ඔය නමම තියෙන දැන්වීමක් අලවලා තිබුණා කියලා. එයා හොඳට කල්පනා කරලා බැලුවා.ඒ පාසලේ පළමු විදුහල්පතිතුමා කියලා එයාට මතක් වුණා. එයා ඊජිප්තු කාලයේ සිට ඉඳලා තියනවා.



නෙතුලි ඒ කාමරයෙන් එළියට ඇවිත් ඉදිරියේ තිබුණු තව කාමරයකට ගියා. එයා ගියා විතරයි ඒ කාමරේ දොර වැහුණා. එයා ඒක අරින්න උත්සාහ කළාට දොරෙහි අගුලු වැටුණා. නෙතුලි දැක්කා පුංචි කොළ කැල්ලක් බිම වැටිලා තියෙනවා. එයා ඒක කියවන්න පිටුපසට හැරුණාම කාමරයේ මමියෝ 12කුයි, අවතාර 4කුයි, ඇටසැකිලි 2කුයි තියෙනවා දැක්කා.



නෙතුලි හොඳාටම බය වුණා , වෙව්ලුවා , ඇඬුවා. එයාලා නෙතුලි ළඟට එන්න පටන් ගත්තා. නෙතුලි දොර මුල්ලට රිංගුවා. එයා තව හුඟක් බය වුණා. දාඩියත් දැම්මා.



එකපාරටම 'ටාං'. උදෑසන 6 සීනුව නාද වුණා. නෙතුලිව කන්න ආපු මමියෝ එයාලාගේ මිනී පෙට්ටි ඇතුළට ගියා, අවතාර අතුරුදහන් වුණා, ඇටසැකිලි කඩාගෙන වැටුණා.



Scanned with
MOBILE SCANNER

එයා ආයෙම  පාසලට යනකොට මෙතුලි දුවගෙන ආවා. “මෙතුලි, ඔයා හෙට මාත් එක්ක එන්න ඕන පොඩි වැඩක් කරන්න. දැන් අපි පන්තියට යමු.” නෙතුලි කිව්වා. “ හරි හරි, මොනවා කරත් පරිස්සම් වෙමු.” මෙතුලි කිව්වා.



නෙතුලියි ,මෙතුලියි පාසල ඇරිලා නෙතුලිගේ කාමරයට ගියා. නෙතුලි එයාට වුණු හැම දෙයක්ම මෙතුලිට කිව්වා.නෙතුලි එයාට හම්බවුණු කොළ කෑල්ල මෙතුලි එක්ක කියෙව්වා . ඒකේ මෙහෙම තිබුණා,

**“පාසලේ ප්‍රධාන ශාලාවේ තිර රෙදි පිටුපස සඟවා ඇති කුප්පියට අළු ස්වල්පයක් දමා, රතු පැහැති දිලිසෙන කුඩුද දමා, නේවාසිකාගාරයට දමන්න.එවිට අවතාර නැතිවේ.”**


Scanned with MOBILE SCANNER

නෙතුලියි , මෙතුලියි ඒ කුප්පිය සොයාගෙන තිබුණු මිශ්‍රනය ඒ ආකාරයටම හැදුවා. එයාලා දෙන්නා ආපසු රෑ හොරෙන්ම පරණ නේවාසිකාගාරයට ගියා. ගිහින් මිශ්‍රනය ඒ ඉසුවා. ඒ වෙලාවේම ඒ නේවාසිකාගාරය අතුරුදහන් වුණා. එයාලා හිටියේ එයාලාගේ කාමරයේ. පාසලේ හැමෝම එයාලට ස්තුති කළා. එදා ඉඳන් ඒ නේවාසිකාගාරයේ පිංතූරයක්වත් ඒ පාසලේ තිබුණේ නෑ!



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

**ISBN 978-624-206-989-0**